# ඉස්ලාම්

# DRAFT

## ගුරු මාර්ගෝපදේශය

### පළමුවන ශ්‍රේණිය


මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපැල : info @ nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

# ඉස්ලාම්

## ගුරු මාර්ගෝපදේශය

### පළමුවන ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

විද්‍යුත් තැපැල : info @ nie.lk
වෙබ් අඩවිය : www.nie.lk

**ඉස්ලාම්**

**පළමුවන ශ්‍රේණිය**

**ගුරු මාර්ගෝපදේශය**

ප්‍රථම මුද්‍රණය - 2015

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN .................

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info @ nie.lk

*මුද්‍රණය* :

# අධ්‍යක්‍ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

මෙම ගුරු මාර්ගෝපදේශය මගින් ගුරුභවතාට තම පාසල තුළ විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන මූලික දෑ සැපයේ. විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරුන් තම කාර්යයන්, දරුවාගේ බුද්ධි වර්ධනය කෙරෙහි මෙන් ම, චර්යාත්මක දියුණුව කෙරෙහි ද දිගු කාලීන බලපෑමක් ඇති කරවන බව නිරන්තරයෙන් ම සිහි තබා ගත යුතු වේ.

ප්‍රජානන සාධන මානය සම්බන්ධයෙන්, අනෙක් කරුණු අතරට, ඉගෙනීම ඉහළ මට්ටමකට ගෙන යාමට පහත සඳහන් කරුණු කෙරෙහි ද ගුරුවරුන් සැලකිලිමත් විය යුතු වේ.

- ශිෂ්‍යයා තම ජීවිත අරමුණු පිළිබඳ අවදියෙන් සිටීම සහ කළ යුතු කාර්යය, හැකියාවන්ට සහ අරමුණු සාධනයට අදාළ වීම.
- ශිෂ්‍යයා ක්‍රියාකාරීව ඉගෙනුම් කාර්යාවලියෙහි නිරත වීම. (ඉගෙනීම සිසු කේන්ද්‍රීය ක්‍රියාවලියක් වීම.) කන්පියුසියස් ගේ කියමන සිහියට නගා ගන්න; ඇසෙන දේ අමතක වේ. දකින දේ අමතක නොවේ. කළ දේ ඉගෙන ගැනේ.
- ඉගෙනුම් වාතාවරණය, ධනාත්මක ව, අභියෝගාත්මක වී, ඉගෙනුම් මෙවලම්, උපකරණ, විද්‍යාගාර, විවිධ සම්පත් ආකාරවලට පිවිසුම පහසු වීම.
- ශිෂ්‍යයාට ක්ෂණික ධනාත්මක සහ නිර්මාණාත්මක ප්‍රතිචාරයන් ලබා දීම මගින්, ඉගෙනුම ක්‍රමානුකූල ව ඉහළ මට්ටමක අවශෝෂණයකින්, ශිෂ්‍යයාගේ දැනුම, කුසලතා සහ අරමුණු සමග අනුකලනයකට අවකාශ ඇති කිරීම.

අධ්‍යාපනයේ දී, රජයේ අපේක්ෂාව වනුයේ සියලු පාසල්වල සියලු දරුවන්ට, මූලික විෂය කරුණු අවශ්‍ය මට්ටමකට ග්‍රහණය කිරීමෙන්, විභාගයට මුහුණ දීමෙන් පසුව සාර්ථකත්වයේ සතුට විඳ ගැනීමේ හැකියාව ලබාදීමය.

දරුවාගේ චර්යාත්මක වර්ධනයට අදාළ මානය සලකා බැලූ විට අධ්‍යාපනයේ පරමාර්ථය වනුයේ ප්‍රජානන හැකියාවන් වැඩ ලෝකය සමග සම්බන්ධ කිරීමයි. එබැවින් ගුරුවරුන් තමතින් විෂය නිර්දේශ ලබා දීමේ දී වර්ධනය කළ යුතු වන්නේ, පාසලින් බැහැර ලෝකය සමග ගනුදෙනු කිරීමට ශිෂ්‍යයාට අවශ්‍ය වන, දක්ෂතා සහ කුසලතා ය. එයින් සමහර වැදගත් ගණීය හැකියාවන් පහත සඳහන් ක්ෂේත්‍රයන් හි වේ.

- කාර්යශීලී වැඩ ආචාර ධර්ම - සාධනීය ආකල්ප සහ නව නිර්මාණයට, සංරක්ෂණයට ඇති ලැදියාව
- අන්තර් පුද්ගල සම්බන්ධතා - කණ්ඩායම් වැඩ, විනය සහ කාර්යක්ෂම සන්නිවේදනය
- සදාචාරාත්මක හර - විවිධත්වයට ගරු කිරීම වැනි පුරවැසි වටිනාකම්වලින් හෙබි, සෘජු පුද්ගලයෙක්

අවසාන වශයෙන් මම සියලු විදුහල්පතිවරුන්ටත්, ගුරු භවතුන්ටත්, පාසල්වල අනෙක් කාර්ය මණ්ඩල සභිකයන්ටත්, ඉතා ඕනෑකමින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය දෙස කළමනාකරණයේ ඒ 4 වශයෙන් හඳුන්වන පහත සඳහන් කරුණු මගින් තම සැලකිල්ල යොමු කරන මෙන් ඉල්ලීමට කැමැත්තෙමි. එනම් ආකල්පය, විශ්ලේෂණය, ක්‍රියාව සහ වගවීමයි. ඔබ නියුක්ත වන කාර්යයෙහි (පාඩම ආදී වශයෙන්) අවසානයත්, මාර්ගයන් පිළිබඳ අදාළ සාධනීය ආකල්පයන්ගෙන් ආරම්භ කරන්න. එය සංවිධානය කර ගැනීම උදෙසා (වරු ඒකක ආදී වශයෙන්) තොරතුරු සොයා බලා ලබාගෙන ඒවා විශ්ලේෂණය කරන්න. විකල්ප සලකා බලා ක්ෂණික ක්‍රියා (ප්‍රකාශ කිරීම, බාරදීම) කාර්යක්ෂමව ගන්න. ඔබ ප්‍රතිඵල අධීක්ෂණය, ඇගැයීම සහ මිණුම සම්බන්ධයෙන් (අයිතිය) වගකීම බාර ගන්න.

මේ හා සම්බන්ධ සියලු ගුරු භවතුන්ට, ඉගැන්වීමේ දීත්, ඉගෙනීමේ දීත් සතුට අත්වේවා යයි ප්‍රාර්ථනා කිරීමට මම මෙය අවස්ථාව කර ගනිමි. අවශ්‍ය වුවහොත් මට ද පිටපතක් සහිතව ජාතික අධ්‍යාපන ආයතනයේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට මෙම ගුරු මාර්ගෝපදේශය පිළිබඳ ඔබේ අත්දැකීම් සහ නිරීක්ෂණ ලියා දන්වා එවීමට නොපසුබට වන්න.

**මහාචාර්ය ගුණපාල නානායක්කාර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමි ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මත බැහැර කිරීමට ද, සුභාවිත තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද, මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේද හා පහසුකම් ද, අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ සහ සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක් වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතා මෙන් ම පුරාතන උරුම ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කර ගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණ තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශවල ඉගෙනුම් ක්‍රමවේද, අකුරක් වත් වෙනස් නො කොට පිළිපැදිය යුත්තක් නම් නො වේ. විෂය නිර්දේශයෙහි තේමා සහ නිපුණතා සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලි ව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන, ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයා හට ද, දෙගුරුනට ද, භාවිත කළ හැකි ය. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නො වන බව දැන ගුරු භවතුන් පෙළ පොත හා මාර්ගෝපදේශය යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයවල සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධන, විෂයය ඉගැන්වීමට මඟ පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනඟා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැ යි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
**භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය,**
**ජාතික අධ්‍යාපන ආයතනය.**

# විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය :**

**උපදේශකත්වය :** ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන ස්වාමින් වහන්සේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය

ඉසෙඩ්. තාජුදීන් මයා
අධ්‍යක්ෂ (ඉස්ලාම් ආගම හා සාරධර්ම) අධ්‍යාපන අමාත්‍යාංශය

මෞලවි එම්. අයි. එම්. නව්ෆර්දීන් මයා
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය

කේ. ඒ. ඩී. පී. සරත්චන්ද්‍ර මහතා
අධ්‍යක්ෂ (මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන)
ජාතික අධ්‍යාපන ආයතනය

**අනුමැතිය** : ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** : නදී අමා ජයසේකර මිය
අධ්‍යාපනඥ, ජාතික අධ්‍යාපන ආයතනය

කේ. ආර්. එම්. සකුන්තලා රණසිංහ මිය
සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

**ලේඛක මණ්ඩලය :**

**අභ්‍යන්තර සම්පත් දායකත්වය -**

නදී අමා ජයසේකර මිය

**බාහිර සම්පත් දායකත්වය -**

ඉසෙඩ්. තාජුදීන් මයා

මෞලවි එම්. අයි. එම්. නව්ෆර්දීන් මයා

මෞලවි එම්. අයි. හච්චි මොහමඩ් මයා,
ගුරු උපදේශක (ඉස්ලාම්), සම්මන්තුරෙයි අධ්‍යාපන කලාපය

අල්ලාපිච්චෙ අයිනුල් ෆාතිමා මිය
(ගුරු සේවය) කො/මුස්ලිම් කාන්තා විදුහල

ජී. එම්. එම්. රzසූල්ඩීන් මිය
(ගුරු සේවය) කො/අල් හික්මා විදුහල

යෙස්මින් හිzසාර් මිය (
ගුරු සේවය) කො/සහිරා විදුහල

**භාෂා සංස්කරණය :** ඊ. ආර්. නිමල් ප්‍රේමකුමාර මයා- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,
සිංහල භාෂා දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සංස්කරණය :** මෞලවි එම්. අයි. එම්. නවුෆර්දීන් මයා,
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය

# ඉස්ලාම් ගුරු මාර්ගෝපදේශය පරිශීලනයට උපදෙස්

ඉස්ලාම් යනු ජීවන මාර්ගයකි. මෙම විෂයය සකස් වන්නේ එම ජීවන මාර්ගය හැදෑරීමේ ක්‍රමයක් වශයෙනි. බාල පරපුර විවිධ ආයතන මගින් ඉස්ලාම් විෂයය හදාරන මුත් ගුරුවරයකුගේ මග පෙන්වීම සහිත ව සිදු වන අන්‍යෝන්‍ය සන්නිවේදනය සහිත පාසල් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය මගින් ඉස්ලාම් ධර්මය සිසුන්ගේ සිත්සතන්වල සනිටුහන් කිරීමත්, ඔවුන්ගේ ප්‍රායෝගික ජීවිතයට කාවැද්දීමත්, වඩා පහසු ය.

ආගමික අධ්‍යාපනයේ අවශ්‍යතාව වත්මන් සමාජ වාතාවරණය තුළ කැපී පෙනෙයි. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ වාර්තාවේ අන්තර්ගත ආචාර ධර්ම හා ආගමට අදාළ නිපුණතා පමණක් නොව සෙසු නිපුණතා වර්ධනය සඳහා ද ඉස්ලාම් ධර්මයට විශාල මෙහෙයක් කළ හැකි ය. ඒ ඔස්සේ ජාතික පොදු අරමුණු කරා ළඟා වීමට ඉවහල් වන පරිදි ප්‍රාථමික අවධියේ ඉස්ලාම් ධර්මය විෂය නිර්දේශය සැකසී ඇත.

## ප්‍රාථමික අවධිය සඳහා වන නිපුණතා

- අල්ලාහ් සිටින බව පිළිගෙන සෑම අවස්ථාවක ම ඔහු සිහිපත් කරයි.
- අර්කානුල් ඊමාන් පිළිගෙන ක්‍රියාත්මක කරයි.
- අර්කානුල් ඉස්ලාම් පිළිගෙන ක්‍රියාත්මක කරයි.
- එදිනෙදා ජීවිතයේ දී මුස්ලිම්වරු පිළිපැදිය යුතු සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කරයි.
- දෛනික ජීවිතයේ දී මුස්ලිම් ආචාර ධර්ම අඛණ්ඩ ව පිළිපදියි.
- සාමූහික ජීවිතයට අදාළ ගුණධර්ම හා සාරධර්ම (අහ්ලාක් හා ආදාත්) පිළිපදියි.
- නබි (සල්) තුමාණන් කෙරෙහි සෙනෙහසින් යුතු ව එතුමාණන්ගේ ආදර්ශ පිළිපදිමින් ජීවත් වෙයි.
- අල් කුර්ආනය හැඳින, පාරායනය කර, එහි උපදෙස් පිළිපදියි.
- මස්ජිදය මුස්ලිම්වරුන්ගේ පූජනීය ස්ථානය බව ප්‍රකාශ කරයි.
- ඉස්ලාමීය ඉතිහාසයේ බිහි වූ විද්වතුන්ගේ ප්‍රතිපත්ති අගය කරමින් ඒවා ආදර්ශයට ගනියි.

**1 - 5 ශ්‍රේණි දක්වා ප්‍රාථමික අවධියේ ඉස්ලාම් ධර්මය පිළිබඳ ඉගෙනුම් අත්දැකීම් ලබන සිසුන්, ප්‍රාථමික අවධිය අවසාන කරන විට උක්ත නිපුණතාවලට ළඟා වීම අපේක්ෂා කෙරේ. ඒ සඳහා අදාළ විෂය අන්තර්ගතය, විෂය නිර්දේශවල දක්වනු ලබන අතර ඊට අදාළ ව ක්‍රියාකාරකම් පාදක ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා යෝජනා කර ඇති ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය වඩාත් නිර්මාණශීලී ව භාවිත කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් අත්දැකීම් ලබා ගැනීමේ දී ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරකයක් ලෙස පමණක් පෙළ පොත යොදා ගැනීම සුදුසු ය.**

### ඉගැන්වීමේ ක්‍රමෝපාය

ප්‍රාථමික ශ්‍රේණිවල ඉස්ලාම් ඉගැන්වීමේ දී කුඩා දරුවන් ප්‍රිය කරන ආගමික ජීවිතය හා සමීප ක්‍රියාකාරකම් බහුල ලෙස යොදා ගත යුතු වේ. ආගමික චාරිකා, මස්ජිදය නැරඹීම, වත්පිළිවෙත් මේ අතර ප්‍රධාන තැනක් ගනියි.

තව ද ඉස්ලාමීය ඉතිහාසයේ බිහි වූ විද්වතුන් ගේ තොරතුරු, නබි (සල්) තුමාණන් සම්බන්ධ ආදර්ශවත් කතා දෘශ්‍යාධාර සමග රසවත් ව ඉදිරිපත් කළ යුතු ය. මේ හා සම්බන්ධ ගායනා, රංගන, චිත්‍ර ඇඳීම වැනි සෞන්දර්ය මුසු ක්‍රියාකාරකම්වල දරුවන් නිරත කරවීමට ද නිරන්තරයෙන් අවධානය යොමු කළ යුතු වෙයි. එය ශිෂ්‍යයාට වින්දනයක් ගෙන දෙන ලෙස ඉතාමත් සුන්දර ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් බැවින් එම ක්‍රමවේද සියල්ල මගින් ඉස්ලාම් ඉගෙනීමට දැඩි ආශාවක් දරුවන් තුළ ඇති වනු ඇත. එ මෙන් ම දරුවා තුළ ක්‍රමයෙන් අල්ලාහ් පිළිබඳ විශ්වාසය තහවුරු කිරීමක් ද සිදු වේ.

**පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්**

පාසල් සංස්කෘතිය හා සම්බන්ධ වැඩසටහන්වලින් ඉස්ලාම් විෂයය සම්බන්ධ බොහෝ නිපුණතා ආවරණය කළ හැකි ය. එසේ ම තහවුරු කළ හැකි ය. තව ද පාසල් සංස්කෘතිය තුළ මෙම නිපුණතා ගොඩ නැගෙන නව අංග ඇති කිරීම කෙරෙහි ද විදුහල්පතිවරුන්ගේ සුවිශේෂ අවධානය යොමු කිරීම අපේක්ෂා කෙරේ.

ප්‍රාථමික පාසල සඳහා ක්‍රියාත්මක වන උදය ආගමික වැඩසටහන් මේ අතර ප්‍රධාන තැනක් ගනියි. පළමු වන ශ්‍රේණියේ දී ඉතා සරල ව අරඹා පස් වන ශ්‍රේණිය දක්වා මෙම වැඩසටහන ක්‍රමයෙන් දියුණු කරමින් විවිධ අංග එක් කළ හැකි ය.

පවිත්‍රතාව, විනීත බව, සහයෝගය, ගුරුවරුන් කෙරෙහි පැවැත්විය යුතු ආචාර ධර්ම, ආශිර්වාද ඇසුරෙන් ගොඩ නැගෙන සමානාත්මතාව, සුහදත්වය, සහෝදරත්වය ආදි ලක්ෂණවලින් පාසල් පරිසරය හා සම්බන්ධ සංස්කෘතිය අලංකාර කෙරේ. ඉහත සංස්කෘතිය තුළ කතෝලික ධර්මය විෂයයෙන් අපේක්ෂිත නිපුණතා වර්ධනය වන අවස්ථා උදා කළ හැකි ය. මෙ මගින් විෂය අන්තර්ගතය තුළ ඇති සියල්ල ප්‍රායෝගික භාවිතයට ද අවස්ථා උදා වේ.

**තක්සේරු කිරීම**

ප්‍රාථමික ශ්‍රේණිවල දී ලිඛිත පරීක්ෂණ වැනි ඇගයීම්වලට වඩා ප්‍රමුඛත්වය දිය යුතු වන්නේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරු කර ගත් ඇගයීම්වලට ය. නිරීක්ෂණය, ගවේෂණය, ක්ෂේත්‍ර චාරිකා, අභිනය, නාට්‍ය, රූකඩ, සාකච්ඡා, වාචික ප්‍රශ්න වැනි ඇගයීම් මේ සඳහා උචිත වෙයි.

# පටුන

පිටුව


| | |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවුඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවුඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ඉස්ලාම් ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | iv |
| විෂය නිර්දේශය | ix |
| ඉගෙනුම් - ඉගැන්වීම ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1 |

# විෂය නිර්දේශය

# හැඳින්වීම

ජාතික අරමුණු ඉටු කර ගැනීම සඳහා පාදක වන මූලික නිපුණතා ඇසුරින් 'ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා' දරුවන් තුළ ගොඩනැංවීම 'ආගම' විෂයයේ වගකීම වෙයි.

කුඩා දරුවකුගේ ළපටි මනසෙහි අලුත් යමක් රෝපණය කිරීම පහසු ය, එ සේ ම යහපත් චර්යා සහ වත් පිළිවෙත්වලට කුඩා දරුවකු අනුගත කිරීම ද වඩා ඉක්මනින් කළ හැකි ය. කුඩා දරුවකු තුළ පවත්නා එම ගුණාංගවලට මනා ව ගැළපෙන සේ මෙහි විවිධ ක්‍රියාකාරකම් යෝජනා කර ඇත. විෂය අන්තර්ගතයට අනුකූල ව සිසු දරුවාට අදාළ නිපුණතාව ලබා දෙමින් ඉගෙනුම් පල සාක්ෂාත් කර ගැනීමට එම ක්‍රියාකාරකම් ඔබට මාර්ගෝපදේශයක් වනු ඇතැ යි අපේක්ෂා කෙරේ.

සමාජයක සාමය සහ සදාචාරය පවත්වා ගැනීමට සියලු ම ආගම්වලින් ලැබෙන දායකත්වය සුළුපටු නො වේ. තව ද, තමා හැම අයුරින් ම පෝෂණය කර ගුණාත්මක ජීවිතයක් ගත කිරීමට ශ්‍රම දායකත්වය සපයන මිනිස් සමාජයට කෘතවේදී වෙමින් පෙරළා අවංක සේවයක් කිරීමටත්, යහගුණවලින් හෙබි මනුෂ්‍යයකු ලෙස අභිමානයෙන් යුතු ව ජීවත් වීමටත්, ආගමකින් ලැබෙන පන්නරය අතිමහත් ය. එ පමණක් නො ව අප එකිනෙකා විශ්වාස කරන පරිදි මරණින් ඔබ්බෙහි දී ද යහපතක් උදා කර ගැනීම සඳහා ආගමික ඉගැන්වීම් අපට නිසැක ව ම පිහිට වෙයි.

දැහැමි සමාජයක් බිහි කිරීමේ උදාර කර්තව්‍යය ආරම්භ කළ යුත්තේ ප්‍රාථමික අවධියේ කුඩා දරුවා ගෙනි. ඒ මහඟු කර්තව්‍යය භාර ගෙන සිටින භාග්‍යවන්ත වූ ගුරුභවතා ඔබ යි. ඒ සඳහා ඔබෙන් ලැබෙන දායකත්වය සහ කැපවීම මහත් සේ අගයමු.

# ජාතික අරමුණු

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගවලට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම සහ හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මත සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවලට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

i. **සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රවල දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

ii. **පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගය
- චිත්තවේගී බුද්ධිය

iii. **පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරවලට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුම පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතාව, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යා, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදාය, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම් යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා

iv. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
- හැකියාවලට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියා උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

v. **ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අදාළ අගය උකහා ගැනීම හා ස්වීයකරණය


vi. **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**


සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටා තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

vii. **ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා**

ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙන ගැනීමත්, සඳහා පුද්ගලයින්ට ශක්තිය ලබා දීම

# ප්‍රාථමික විෂයමාලා සැලැස්ම



# කාලය බෙදා ගැනීම

## පළමු වන ප්‍රධාන අවධිය (පළමු වන සහ දෙ වන ශ්‍රේණි)

| විෂයය | | සතියකට වෙන් කර ඇති කාලය |
|---|---|---|
| 1. | මවු බස | පැය 5.00 |
| 2. | ගණිතය | පැය 3.30 |
| 3. | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 5.30 |
| 4. | ආගම | පැය 1.15 |
| 5. | දෙවන ජාතික භාෂාව | මිනිත්තු 30 |
| 6. | උදය රැස්වීම සහ ආගමික වතාවත් | පැය 1.15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 7. | විවේක කාලය | පැය 1.15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 8. | ආහාර ගැනීම සඳහා | මිනිත්තු 50 (දිනකට මිනිත්තු 10 බැගින්) |
| 9. | ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය 1.40 (දිනකට මිනිත්තු 20 බැගින්) |
| 10. | විෂය සමගාමී ක්‍රියාකාරකම | මිනිත්තු 30 (සතියේ එක් දිනෙක) |
| | **සතියක මුළු කාලය** | පැය 21.15 |

# විෂය අරමුණු

1. දරුවන් තුළ අල්ලාහ් පිළිබඳ විශ්වාසය තහවුරු කිරීම
2. අල්ලාහ් විසින් මුහම්මද් නබි (සල්) තුමාට පහළ කරන ලද අල් කුර්ආනයට නිසි ගෞරව දැක්වීමටත්, ඒ අනුව ජීවිතය හැඩගස්වා ගැනීමටත්, යොමු කිරීම
3. ඊමාන්(විශ්වාස) කළ යුතු කරුණු හය පිළිපදිමින් ඉස්ලාමීය ප්‍රතිපත්ති ඇති කර ගැනීමට මග පෙන්වීම
4. නබිවරු ඇතුළු සලෆුස්සාලිහීන්වරුන්ගේ චරිතාපදාන ඇසුරින් ලබා ගන්නා ආදර්ශවලට අනුකූල වූ ජීවන දර්ශනයක් ගොඩනැංවීම
5. ඉස්ලාමීය සිරිත්විරිත් පිළිපදින්නා වූත්, මුස්ලිම් අනන්‍යතාව ප්‍රදර්ශනය කරන්නා වූත්, චර්යා ඇති කිරීම
6. දික්ර්, අව්රාද්, සහ සූරා නිවැරදි ව උච්චාරණය කරමින් පාරායනය කිරීමටත්, විශ්වාසයෙන් යුතු ව ආගමික වතාවත්වල නිරත වීමටත්, පුරුදු පුහුණු කරවීම
7. මස්ජිදය දේව නිවස වශයෙන් සලකා ගෞරව කිරීමට පෙලඹවීම
8. ඉස්ලාමයේ ඉගැන්වෙන පරිදි සියල්ලන්ට ම ආදරය දැක්වීම, උදව් කිරීම, අසල්වැසියන් සමග එකමුතු ව ජීවත් වීම සම්බන්ධ අත්දැකීම් ලබා දීම
9. උපවාසයෙහි යෙදීමේ ප්‍රතිපත්තිමය වටිනාකමත්, හජ් වන්දනාව ඉටු කිරීමේ වැදගත්කමත් පිළිබඳ අවබෝධයක් ලබා දීම
10. අන්‍යාගමික සිරිත්වලට ගරු කරමින් සහයෝගයෙන් ජීවත් වීමේ ආකල්ප රෝපණය කිරීම

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 1.0 අල්ලාහ් සිටින බව පිළිගෙන සැමවිට ම අල්ලාහ් සිහිපත් කිරීම | 1.0 අල්ලාහ් සිටින බව පිළිගෙන සෑම අවස්ථාවක ම ඔහු සිහිපත් කරයි. | 1.1 යහපත් කටයුතු ආරම්භ කිරීමේ දී බස්මලා පැවසීම<br>• බස්මලාහි නිවැරැදි උච්චාරණය<br>• බස්මලා පවසන අවස්ථා<br>* ආහාර අනුභවයට පෙර<br>* නින්දට යාමට පෙර<br>* නිවස තුළට පිවිසීමට පෙර<br>* කුර්ආන් පාරායනයට පෙර<br>* ඉගෙන ගැනීමට පෙර |
| | | 1.2 අයහපතින් මිදීම සඳහා අල් ඉස්තිආදා පැවසීම<br>• අල් ඉස්තිආදාහි නිවැරැදි උච්චාරණය<br>• අල් ඉස්තිආදා පවසන අවස්ථා<br>* ආරක්ෂාව පතන විට<br>* නරක (අයහපත්) සිතිවිලි ඇති වන විට<br>* ඈනුම් අරින විට<br>* පාප ක්‍රියාවලට මනස යොමු වන විට |
| | | 1.3 සතුටට පත් වූ අවස්ථාවල දී අත්තහ්මිද් පැවසීම<br>• අත්තහ්මිද්හි නිවැරදි උච්චාරණය<br>• අත්තහ්මිද් පවසන අවස්ථා<br>* අල්ලාහ්ට ස්තුති කිරීමේ දී<br>* අන් අයගේ ප්‍රසංශා භාර ගැනීමේ දී<br>* අල්ලාහ්ගේ ශක්තිය වටහා ගැනීමේ දී<br>* අල්ලාහ්ගේ දයාවන් ලැබෙන විට<br>* දුක් කරදරවලින් මිදෙන විට<br>* බලාපොරොත්තු ඉටු වූ විට |
| | | 1.4 අල්ලාහ් සිහිපත් වීමේ දී<br>• අත්තහ්ලීල්හි නිවැරැදි උච්චාරණය<br>• අත්තහ්ලීල් පවසන අවස්ථා<br>* අල්ලාහ්ට දික්ර් කිරීමේ දී<br>* නැමැදීමට සුදුස්සා බව තහවුරු කිරීමේ දී |
| 2.0 අර්කානුල් ඊමාන් | 2.0 අර්කානුල් ඊමාන් පිළිගෙන ක්‍රියාත්මක කරයි. | 2.1 අර්කානුල් ඊමාන්<br>• අල්ලාහ් විශ්වාස කිරීම |
| 3.0 අර්කානුල් ඉස්ලාම් | 3.0 අර්කානුල් ඉස්ලාම් පිළිගෙන ක්‍රියාත්මක කරයි. | 3.1 'අල් කලිමතුත් තයියිබා'<br>• අල් කලිමතුත් තයියිබා නිවැරැදි ව උච්චාරණය |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 4.0 අත්තහාරා | 4.0 එදිනෙදා ජීවිතයේ දී මුස්ලිම්වරු පිළිපැදිය යුතු සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කරයි. | 4.1 පෞද්ගලික පිරිසිදුකම<br>• අත්පා, මුහුණ, දත් ආදි අවයව පිරිසිදු ව තබා ගැනීම |
| | | 4.2 පරිසරයේ පිරිසිදුකම<br>• නිවස සහ අවට පරිසරය පිරිසිදු ව තබා ගැනීම<br>• පන්ති කාමරය පිරිසිදුව තබා ගැනීම |
| 5.0 ඉස්ලාමීය ආචාර ධර්ම | 5.0 දෛනික ජීවිතයේ දී මුස්ලිම් ආචාර ධර්ම අඛණ්ඩ ව පිළිපදියි. | 5.1 අනුභව කිරීමේ දී හා පානය කිරීමේ දී අනුගමනය කළ යුතු පිළිවෙත්<br>• ආහාර අනුභවයේ දී, අත් දෙක ම සේදීම<br>• පිරිසිදු ඇතිරිල්ලක ආහාර භාජන තැබීම<br>• බිස්මි පැවැසීම<br>• දකුණු අතින් අනුභව කිරීම හා පානය කිරීම<br>• අන් අයට බාධා නො වන පරිදි අනුභව කිරීම<br>• නො ඉහිරෙන ආකාරයට අනුභව කිරීම<br>• කුඩා ප්‍රමාණවලින් අනුභව කිරීම<br>• පිරිසිදු ඇතිරිල්ලෙහි බිම වැටෙන කොටස් ඇහිඳ අනුභව කිරීම<br>• ටිකෙන් ටික (උගුරෙන් උගුර) ජලය පානය<br>• 'අල්හම්දු ලිල්ලාහ්' යනුවෙන් පවසා අල්ලාහ්ට ප්‍රශංසා කිරීම |
| | | 5.2 ඇඳුම් ඇඳීමේ දී අනුගමනය කළ යුතු පිළිවෙත්<br>• ඇඳීමට පෙර ඇඳුම් ගසා ගැනීම<br>• ඇඳුම් ඇඳීමේ හා ගැලවීමේ දී අදාළ දුආ පැවසීම<br>• ඇඳුම් ඇඳීමේ දී දකුණටත්, ගැලවීමේ දී වමටත්, මුල් තැන දීම<br>• ඇඳුම් අදාළ ස්ථානයේ පිළිවෙළට තැබීම |
| 6.0 අහ්ලාක් සහ ආදාත් | 6.0 සාමූහික ජීවිතයට අදාළ ගුණධර්ම හා සාරධර්ම (අහ්ලාක් හා ආදාත්) පිළිපදියි. | 6.1 ආදරය දැක්වීම හා කීකරු වීම<br>• දෙමාපියන්, සහෝදර සහෝදරියන්, ඥාතීන් හා ගුරුවරුන් කෙරෙහි ආදරය දැක්වීම හා ඔවුන් ගේ යහපත් ඔවදන්වලට කීකරු වීම |
| | | 6.2 සාමූහික ව ජීවත් වීම/එක් ව ජීවත් වීම<br>• අන්‍යයන් සමග සාමූහික ව ජීවත් වීම<br>• බෙදා හදා ගැනීම<br>• එකමුතු ව සිටීම |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 7.0 නබි(සල්) තුමාණන්ගේ ආදර්ශ | 7.0 නබි (සල්) තුමාණන් කෙරෙහි සෙනෙහසින් යුතු ව එතුමාණන්ගේ ආදර්ශ පිළිපදිමින් ජීවත් වෙයි. | 7.1 මුහම්මද් නබි (සල්) තුමා<br>• මක්කාවෙහි ඉපදීම<br>• දෙමවුපියන් වන අබ්දුල්ලාහ් සහ ආමිනා<br>• මුහම්මද් නබි (සල්) තුමා හඳුන්වන ගෞරව නාම<br>* අස්සාදික් - සත්‍යවන්තයා<br>* අල් අමීන් - විශ්වාසවන්තයා<br>• එතුමා වෙනුවෙන් සලවාත් පැවසීම |
| 8.0 අල් කුර්ආනය | 8.0 අල් කුර්ආනය හැඳින, පාරායනය කර, එහි උපදෙස් පිළිපදියි. | 8.1 අල්ලාහ් විසින් 'අල් කුර්ආනය' නබිතුමාණන්ට පහළ කිරීම<br>• අල් කුර්ආනය හැඳින්වීම<br>• අල් කුර්ආනය පාරායනය<br>* සූරා ෆාතිහාව |
| 9.0 මස්ජිද් | 9.0 මස්ජිදය මුස්ලිම්වරුන්ගේ පූජනීය ස්ථානය බව ප්‍රකාශ කරයි. | 9.1 මස්ජිදය (අල්ලාහ්ගේ මාලිගාව/සලාතය ඉටු කරන ස්ථානය/පාරිශුද්ධ ස්ථානය)<br>• මිහ්රාබ් සහ මිම්බරය |
| 10.0 ඉස්ලාමීය ඉතිහාසය | 10.0 ඉස්ලාමීය ඉතිහාසයේ බිහි වූ විද්වතුන්ගේ ප්‍රතිපත්ති අගය කරමින් ඒවා ආදර්ශයට ගනියි. | 10.1 ඉමාම් ගස්සාලි (රහ්) තුමා<br>• ඉමාම් ගස්සාලි (රහ්) තුමා ඉගෙනීමට යාම |

# ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

## 1. තේමාව : අල්ලාහ් සිටින බව පිළිගෙන සෑම අවස්ථාවක ම ඔහු සිහිපත් කරයි.

**නිපුණතාව : අල්ලාහ් සිටින බව පිළිගෙන සෑම අවස්ථාවක ම ඔහු සිහිපත් කරයි.**

**ඉගෙනුම් පල :** 1.1

- 'බස්මලා' නිවැරදි ව සම්පූර්ණයෙන් ම උච්චාරණය කරයි.
- 'බස්මලා'හි අර්ථය පවසයි.
- 'බස්මලා' පැවසිය යුතු අවස්ථා නම් කරයි.
- සෑම යහපත් කටයුත්තක් ම 'බස්මලා' පවසමින් ආරම්භ කරයි.

**ඉගෙනුම් සම්පත් :**

- 'බස්මලා' අරාබි භාෂාවෙන් ලියා (බිත්තියේ එල්ලීමට හැකි ලෙස සකසන ලද) චාට් සටහනක්
- පටිගත කළ 'බස්මලා' සහ වාදනය කිරීමට අවශ්‍ය උපකරණ
- වර්ණවත් සව් කඩදාසි ගුලි සහ ඒවා ඇලවීමට අවශ්‍ය ද්‍රව්‍ය

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :

පියවර 1 :
- 'බස්මලා' පවසා පාඩම ආරම්භ කරන්න.
- 'බස්මලා' අරාබි භාෂාවෙන් ලියන ලද චාට් සටහන ප්‍රදර්ශනය කරන්න. ('බස්මලා' යන පදය ලිවීමට සිසුන් මෙහෙයවිය යුතු නැත.)
- 'බස්මලා' පැහැදිලි ව උච්චාරණය කර (හෝ පටිගත කරන ලද CD තැටි/වෙනත් විකල්ප ක්‍රමයක් යොදා ගනිමින් විකාශනය කර) සිසුන්ට සවන් දීමට සලස්වන්න.
- 'බස්මලා' කණ්ඩායම් වශයෙන් හා තනි තනි වශයෙන් ක්‍රමානුකූල ව උච්චාරණය කිරීමට සිසුන් මෙහෙයවන්න.

පියවර 2 :
- 'බස්මලා'හි අර්ථය පැහැදිලි කර දෙන්න.
- 'බස්මලා' පැවසිය යුතු අවස්ථා සාකච්ඡා කරන්න.
- සිසුන් සමග සාමූහික ව 'බස්මලා' පැවසීම පිළිබඳ පහත ගීතය ගායනා කරන්න.

**බිස්මිල්ලාහ් බිස්මිල්ලාහ්**
**අනුභවයට පෙර බිස්මිල්ලාහ් - ඉගෙනීමට පෙර බිස්මිල්ලාහ්**
**යහපත් කටයුත්තක දී කියන්නෙ බිස්මිල්ලාහ්**

පියවර 3 :
- 'බස්මලා' අරාබි භාෂාවෙන් ලියන ලද චාට් සටහන ඉදිරිපත් කරන්න.
- සෑම ශිෂ්‍යකුට ම අවස්ථාව ලැබෙන පරිදි එහි අකුරුවල රේඛා දිගේ විවිධ වර්ණයෙන් යුත් සව් කඩදාසි ගුලි ඇලවීමට සිසුන් යොමු කරන්න.
- විචිත්‍ර ලෙස සකසන ලද චාට් සටහන බිත්තියේ එල්ලන්න.
- සිසුන් සමග සාමූහික ව 'බස්මලා' පැවසීම පිළිබඳ ගීතය නැවත ගායනා කරන්න.

**තක්සේරුව :**

- 'බස්මලා' අඩංගු චාට් සටහන විසිතුරු කිරීමට සාමූහික ව දායක වෙයි.
- 'බස්මලා' පවසමින් පන්තියේ කටයුතු ආරම්භ කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- එදිනෙදා සියලු යහපත් කටයුතු ආරම්භයේ දී පුරුද්දක් වශයෙන් 'බස්මලා' පැවසීම

## 1. තේමාව : අල්ලාහ් සිටින බව පිළිගෙන සැමවිට ම අල්ලාහ් සිහිපත් කිරීම

**නිපුණතාව : අල්ලාහ් සිටින බව පිළිගෙන සෑම අවස්ථාවක ම ඔහු සිහිපත් කරයි.**

**ඉගෙනුම් පල :** 1.2

- 'අල් ඉස්තිආදා සම්පූර්ණයෙන් හඬ නගා, නිවැරදි ව, උච්චාරණය කරයි.
- 'අල් ඉස්තිආදාහි අර්ථය පවසයි.
- 'අල් ඉස්තිආදා පැවසිය යුතු අවස්ථා ප්‍රකාශ කරයි.
- අදාළ අවස්ථා ආරම්භයේ දී 'අල් ඉස්තිආදා' පවසයි.

**ඉගෙනුම් සම්පත් :**

- 'අල් ඉස්තිආදා' අරාබි භාෂාවෙන් ලියා (බිත්තියේ එල්ලීමට හැකි ලෙස සකසන ලද) චාට් සටහනක්
- පටිගත කළ 'අල් ඉස්තිආදා' සහ වාදනය කිරීමට අවශ්‍ය උපකරණ
- '**අඋඃදු බිල්ලාහි මිනශ්ශෙයිතානිර්රජීම්**' යනුවෙන් අරාබි භාෂාවෙන් ලියන ලද කුඩා කඩදාසි තීරු (සෑම ශිෂ්‍යයකුට ම එකක් බැගින්)
- චිත්‍ර ඇඳීමට අවශ්‍ය ද්‍රව්‍ය

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :

පියවර 1 :
- 'අල් ඉස්තිආදා' පවසා පාඩම ආරම්භ කරන්න.
- 'අල් ඉස්තිආදා' අරාබි භාෂාවෙන් ලියන ලද චාට් සටහන ප්‍රදර්ශනය කරන්න. ('අල් ඉස්තිආදා' යන පදය ලිවීමට සිසුන් මෙහෙයවිය යුතු නැත.)
- 'අල් ඉස්තිආදා' යනු '**අඋඃදු බිල්ලාහි මිනශ්ශෙයිතානිර්රජීම්**' වෙනුවට ප්‍රකාශ කරන කෙටි වදනක් බව සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- 'අල් ඉස්තිආදා' පැහැදිලි ව උච්චාරණය කර (හෝ පටිගත කරන ලද CD තැටි/වෙනත් විකල්ප ක්‍රමයක් යොදා ගනිමින් විකාශනය කර) සිසුන්ට සවන් දීමට සලස්වන්න.
- 'අල් ඉස්තිආදා' කණ්ඩායම් වශයෙන් හා තනි තනි වශයෙන් ක්‍රමානුකූල ව උච්චාරණය කිරීමට සිසුන් මෙහෙයවන්න.

පියවර 2 :
- 'අල් ඉස්තිආදා' හි අර්ථය පැහැදිලි කර දෙන්න.
- 'අල් ඉස්තිආදා' පැවසිය යුතු අවස්ථා සාකච්ඡා කරන්න.

  *නිද* :
  * ආරක්ෂාව පතන විට
  * නරක සිතුවිලි ඇතිවීමේ දී (අයහපත් සිතුවිලි)
  * ඇනුම් අරින විට දී
  * පාප ක්‍රියාවල නිරත වීමට මනස යොමු වීමේ දී

පියවර 3 :
- '**අඋඃදු බිල්ලාහි මිනශ්ශෙයිතානිර්රජීම්**' යනුවෙන් අරාබි භාෂාවෙන් ලියන ලද කුඩා කඩදාසි තීරුවක් සහ චිත්‍ර කඩදාසියක් සෑම ශිෂ්‍යයකුට ම ලබා දෙන්න.
- චිත්‍ර කඩදාසියේ ඉහළින් කුඩා කඩදාසි තීරුව අලවා, 'අල් ඉස්තිආදා' පවසන කිසියම් අවස්ථාවක් චිත්‍රයට නඟන්නට උපදෙස් දෙන්න.

**තක්සේරුව :**

- 'අල් ඉස්තිආදා' පවසන අවස්ථාවක් චිත්‍රයට නඟයි.
- 'අල් ඉස්තිආදා' නිවැරැදි ව හා සම්පූර්ණයෙන් ම උච්චාරණය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- එදිනෙදා සියලු යහපත් කටයුතු ආරම්භයේ දී පුරුද්දක් වශයෙන් 'බස්මලා' පැවසීම

## 1. තේමාව : අල්ලාහ් සිටින බව පිළිගෙන සැමවිට ම අල්ලාහ් සිහිපත් කිරීම

## නිපුණතාව : අල්ලාහ් සිටින බව පිළිගෙන සෑම අවස්ථාවක ම ඔහු සිහිපත් කරයි

**ඉගෙනුම් පල** : 1.3

- 'අල් හම්දුලිල්ලාහ්' යන වචනය නිවැරදි ව උච්චාරණය කරයි.
- 'අල් හම්දුලිල්ලාහ්' හි අර්ථය ප්‍රකාශ කරයි.
- සතුටට පත් වූ අවස්ථාවල දී 'අල් හම්දුලිල්ලාහ්' යනුවෙන් පවසයි.

**ඉගෙනුම් සම්පත්** :

- 'අල් හම්දුලිල්ලාහ්' යනුවෙන් අරාබි භාෂාවෙන් ලියන ලද විවිධ වර්ණවලින් යුත් බ්‍රිස්ටල් බෝඩ් කිහිපයක් (කණ්ඩායමකට එකක් බැගින්)
- කතුරක්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :

පියවර 1 :
- 'අල් හම්දුලිල්ලාහ්' යනුවෙන් අරාබි භාෂාවෙන් ලියන ලද බ්‍රිස්ටල් බෝඩ් එකක් සිසුනට ප්‍රදර්ශනය කරන්න. ('අල් හම්දුලිල්ලාහ්' යන පදය ලිවීමට සිසුන් මෙහෙයවිය යුතු නැත.)
- 'අල් හම්දුලිල්ලාහ්' යන්න පැහැදිලි ව උච්චාරණය කර පෙන්වන්න.
- 'අල් හම්දුලිල්ලාහ්' යන්න කණ්ඩායම් වශයෙන් හා තනි තනි වශයෙන් උච්චාරණය කිරීමට සිසුන් මෙහෙයවන්න.

පියවර 2 :
- 'අල් හම්දුලිල්ලාහ්' යනුවෙන් අරාබි භාෂාවෙන් ලියන ලද සෑම බ්‍රිස්ටල් බෝඩ් එකක් ම කල්තියා අක්‍රමවත් ව කැබලි කිහිපයකට කපා වෙන් කර ගන්න. (jigsaw puzzle ආකාරයට)

  (එ විට එක බ්‍රිස්ටල් බෝඩ් එකකින් එක කට්ටලයක් බැගින් ලැබේ.)
- ඉන් එක කට්ටලයක් බැගින් සිසු කණ්ඩායම්වලට ලබා දෙන්න.
- සිසු මේස මත ඒවා එකිනෙක ගළපමින් 'අල් හම්දුලිල්ලාහ්' යන්න ලියන ලද චාට් සටහන නිවැරැදි ව ගොඩනැගීමට කණ්ඩායම් යොමු කරන්න.
- තම කාර්යය නිම කළ වහා ම 'අල් හම්දුලිල්ලාහ්' යනුවෙන් හඬ නගා පවසමින් සතුට ප්‍රකාශ කිරීමට උපදෙස් දෙන්න.

පියවර 3 :
- එළිමහනේ කවයක් ලෙස සිසුන් රැස් කර 'අල්හම්දුලිල්ලාහ්' යන අරාබි ප්‍රකාශයෙහි අර්ථය සාකච්ඡා කරන්න.
- 'අල්හම්දුලිල්ලාහ්' පැවසිය යුතු අවස්ථා ඉදිරිපත් කරන්න.

  *නිද* :
  * අන් අය තමන්ට ප්‍රශංසා කරන විට
  * අල්ලාහ්ගේ දයාව ලැබෙන විට
  * දුක් කරදරවලින් මිදෙන විට
  * අවශ්‍යතා ඉටු වන විට
- එදිනෙදා ජීවිතයේ උදා වන සිදුවීම් කිහිපයක් මතු කරමින් එක් එක් ශිෂ්‍යයාට 'අල්හම්දුලිල්ලාහ්' යනුවෙන් පැවැසීමට ඉඩ ලබා දෙන්න.

  *නිද* :
  * ඔයා විභාගයෙන් හොඳට සමත් වෙලා...
  * බලන්න, ලස්සනට ඉර පායලා...
  * ලෙඩ වෙලා හිටිය මාමාට දැන් සනීප යි...
  * අද අපි සතුටින් ඉගෙන ගත්තා නේ ද?...

**තක්සේරුව :**

- කොටස්වලට වෙන් කරන ලද කැබලි ගළපමින් 'අල්හම්දුලිල්ලාහ්' යන ප්‍රකාශය අඩංගු චාට් සටහන ගොඩනගයි.
- 'අල්හම්දුලිල්ලාහ්' යන ප්‍රකාශය නිවැරදිව හා සම්පූර්ණයෙන් ම උච්චාරණය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සතුටට පත් වූ අවස්ථාවල දී 'අල් හම්දුලිල්ලාහ්' යනුවෙන් පවසා අල්ලාහ්ට ප්‍රශංසා කිරීම

## 1 තේමාව : අල්ලාහ් සිටින බව පිළිගෙන සැමවිට ම අල්ලාහ් සිහිපත් කිරීම

**නිපුණතාව : අල්ලාහ් සිටින බව පිළිගෙන සෑම අවස්ථාවක ම ඔහු සිහිපත් කරයි.**

**ඉගෙනුම් පල :** 1.4

- 'අත්තහ්ලීල්' යන්නෙන් අදහස් කෙරෙන්නේ 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' ලෙස පැවසීම බව ප්‍රකාශ කරයි.
- 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යන්න නිවැරදි ව උච්චාරණය කරයි.
- 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යන්නෙහි අර්ථය නිවැරැදි ව පවසයි.
- 'තහ්ලීල්' පැවසීම අල්ලාහ්ට දික්ර් කිරීමක් බව පවසයි.
- 'නැමදීමට සුදුස්සා' යන්න හෙළි කිරීම උදෙසා 'තහ්ලීල්' පවසයි.
- අල්ලාහ් සිහිපත් වන සෑම අවස්ථාවක දී ම 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යනුවෙන් පවසයි.

**ඉගෙනුම් සම්පත් :**

- 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යන්න අරාබි භාෂාවෙන් ලියන ලද චාට් සටහනක්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :

පියවර 1 :
- පාඩම ආරම්භයේ දී ම 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යනුවෙන් භක්තියෙන් යුතු ව පවසන්න.
- 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යන්න අරාබි භාෂාවෙන් ලියන ලද චාට් සටහන ප්‍රදර්ශනය කරන්න. ('ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යන පදය ලිවීමට සිසුන් මෙහෙයවිය යුතු නැත.)
- 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යන්න කණ්ඩායම් වශයෙන් හා තනි තනි වශයෙන් උච්චාරණය කිරීමට සිසුන් මෙහෙයවන්න.

පියවර 2 :
- 'ලා ඉලාහ ඉල්ලල්ලාහ් මුහම්මදුර් රසූලුල්ලාහ්'හි පහත සඳහන් අර්ථය සිසුන්ට පැහැදිලි කර දෙන්න.
  **'නමැදීමට එක ම සුදුස්සා අල්ලාහ් පමණි, අල්ලාහ්ගේ රසූල්වරයා මුහම්මද් නබි (සල්) තුමා වෙයි.'**
- 'අත්තහ්ලීල්' යන්නෙන් අදහස් කෙරෙන්නේ 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' ලෙස පැවසීම බව විස්තර කරමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- 'අත්තහ්ලීල්' හෙවත් 'තහ්ලීල්' පවසන පහත අවස්ථා උදාහරණ ලෙස ගෙන හැර දක්වා සාකච්ඡා කරන්න.
  - * අල්ලාහ් දික්ර් කරන විට
  - * අල්ලාහ් නැමදීමට සුදුස්සා ලෙස හෙළි කරන විට

පියවර 3 :
- සිසුන් පන්තියෙන් පිටතට කැඳවා ගෙන යන්න.
- හැකි සෑම අවස්ථාවක දී ම අල්ලාහ් දික්ර් කළ යුතු බව සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- සිසුන් මිදුලේ පේළියක් ලෙස සකසන්න.
- ඉතා තැන්පත් ව හා සන්සුන් ලෙස පන්තියට ඇතුළු වී 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' ලෙස අල්ප ශබ්දතාවෙන් යුතු ව පවසමින් තමා ගේ අසුනේ හිඳ ගැනීමට යොමු කරන්න.

**තක්සේරුව :**

- 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්'යන්න නිවැරැදි ව උච්චාරණය කර පවසමින් තමා ගේ අසුනේ හිඳ ගනියි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්' යන්න සිහිපත් කිරීම ජීවිත පුරුද්දක් කර ගැනීම

## 2. තේමාව : අර්කානුල් ඊමාන්

**නිපුණතාව : අර්කානුල් ඊමාන් පිළිගෙන ක්‍රියාත්මක කරයි.**

**ඉගෙනුම් පල** : 2.1

- අල්ලාහ්ගේ පැවැත්ම පිළිබඳ විශ්වාස කරයි.
- 'අල්ලාහ් ඒකයෙකි' යන්න පවසයි.
- 'අල්ලාහ් සියල්ල මැවුවේ ය,' යන්න පවසයි.
- 'අල්ලාහ් සියල්ලෙහි ම පරිපාලකයා ය,' යන්න පවසයි.
- 'අල්ලාහ් සියල්ලට ම ශක්තිවන්තයා ය,' යන්න පවසයි.

**ඉගෙනුම් සම්පත්** :

- 'අල්ලාහ්' යන්න අරාබි භාෂාවෙන් ලියන ලද චාට් සටහනක්
- සියල්ල මැවූ අල්ලාහ්ට ස්තුති වේවා යන ගීතය
- පරිසරයේ දර්ශනයක් ගොඩනැංවීමට අවශ්‍ය ක්ලේ, මැටි සහ අනෙකුත් සුදුසු ද්‍රව්‍ය සහ එය ගොඩනැංවීමට පුවරුවක් (ලැල්ලක් වැනි)

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :

පියවර 1 :

- සිසුන් මිදුලට කැඳවා ගෙන ගොස් පරිසරයේ සුන්දරත්වය පෙන්වන්න. (නැතහොත් අලංකාර පරිසරයක පින්තූරයක් පෙන්වන්න.)
- මේ සියල්ල අල්ලාහ් විසින් මවා ඇති බව පැහැදිලි කර දෙන්න.
- අල්ලාහ් ගේ මැවීමට ස්තුති කරමින් සිසුන් සමග එක් ව පහත ගීය ගායනා කරන්න.

**හිරු පායයි - මල් සුපිපෙයි - වැස්ස වසියි - සුළං හමයි**
**මේ හැම මැව් අල්ලාහ් හට අපි තුති පුදමු**
**ශක්තිවන්තයා ඔහු වෙයි, හැම පරිපාලනය කරයි,**
**'අල්ලාහ්' නාමය පවසා අපි තුති පුදමු**

පියවර 2 :

- මීට පෙර පාඩම්වල දී සකසා පන්තියේ ප්‍රදර්ශනයට තබා ඇති බිස්මිල්ලා, අල් ඉස්තිආදා, අල්හම්දුලිල්ලාහ්, ලා ඉලාහ ඉල්ලල්ලාහ්, යන චාට් පත් කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.
- එම ඉගෙනුම් අවස්ථාවල දී පුරුදු පුහුණු වූ අයුරින් අදාළ ප්‍රකාශ නැවත හඬනගා උච්චාරණය කිරීමට සිසුන් මෙහෙයවන්න.
- 'අල්ලාහ්' යන්න අරාබි භාෂාවෙන් ලියන ලද චාට් සටහන ඉදිරිපත් කරන්න.
- 'අල්ලාහ්' පිළිබඳ පහත සඳහන් කරුණු සිසුන් සමග සාකච්ඡා කරන්න.
    * 'අල්ලාහ් සිටින බැවින්, ඔහුගේ නාමය පවසන්නෙමු, ඔහුට ප්‍රශංසා කරමු, ඔහු ගෙන් ම ආරක්ෂාව පතමු.'
    * 'අල්ලාහ් ඒකයෙකි.'
    * 'අල්ලාහ් සියල්ල මැවුවේ ය.'
    * 'අල්ලාහ් සියල්ලෙහි ම පරිපාලකයා ය.'
    * 'අල්ලාහ් සියල්ලට ම ශක්තිවන්තයා ය.'

පියවර 3 :

- පරිසරයේ දකින ගස්, සතුන්, දිය දහර, ආදී විවිධ දේ ඇඹීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය (ක්ලේ, මැටි සහ වෙනත්) සිසුන්ට ලබා දෙන්න. (සෑම ශිෂ්‍යයකු ම ඇතුළත් වන සේ)
- බිස්මිල්ලා/අල් ඉස්තිආදා පවසා තමා කැමති දෙයක් නිර්මාණය කිරීම ආරම්භ කරන ලෙස උපදෙස් දෙන්න.
- සියලු ම සිසුන් නිර්මාණය කළ දේ සුදුසු පරිදි ස්ථානගත කරමින් පුවරුව මත පරිසරයේ ආකෘතියක් ගොඩ නංවන්න.
- සියලු ම දෙනා ගේ සාමූහික නිර්මාණය පිළිබඳ සතුටු වෙමින් 'අල්හම්දුලිල්ලාහ්' යැයි හඬ නඟා පැවසීමට අවස්ථාව දෙන්න.

**තක්සේරුව :**

- අල්ලාහ් ගේ මැවීමට ස්තුති කරමින් ගීතයක් ගායනා කරයි.
- පරිසරයේ දර්ශනයක් නිර්මාණය කිරීමට දායක වෙයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- අල්ලාහ් කෙරෙහි විශ්වාසයෙන් යුතු ව සියලු කටයුතු කිරීම

## 3. තේමාව : අර්කානුල් ඉස්ලාම්

**නිපුණතාව : අර්කානුල් ඉස්ලාම් පිළිගෙන ක්‍රියාත්මක කරයි.**

**ඉගෙනුම් පල** : 3.1

- 'කලිමතුන් තයියිබා' නිවැරදි ව උච්චාරණය කරයි.
- 'කලිමතුන් තයියිබා' කටපාඩමින් පවසයි.

**ඉගෙනුම් සම්පත්** :

- 'කලිමතුන් තයියිබා' අරාබි භාෂාවෙන් ලියා (බිත්තියේ එල්ලීමට හැකි ලෙස සකසන ලද) චාට් සටහනක්
- පටිගත කළ 'කලිමතුන් තයියිබා' සහ වාදනය කිරීමට අවශ්‍ය උපකරණ

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :

පියවර 1 :
- 'කලිමතුන් තයියිබා' අරාබි භාෂාවෙන් ලියන ලද චාට් සටහන ප්‍රදර්ශනය කරන්න. ('කලිමතුන් තයියිබා' ලිවීමට සිසුන් මෙහෙයවිය යුතු නැත.)
- 'කලිමතුන් තයියිබා' පැහැදිලි ව උච්චාරණය කර (හෝ පටිගත කරන ලද CD තැටි/වෙනත් විකල්ප ක්‍රමයක් යොදා ගනිමින් විකාශනය කර) සිසුන්ට සවන් දීමට සලස්වන්න.
- 'කලිමතුන් තයියිබා' කණ්ඩායම් වශයෙන් හා තනි තනි වශයෙන් උච්චාරණය කිරීමට සිසුන් මෙහෙයවන්න.

පියවර 2 :
- සිසුන් මිදුලට රැගෙන ගොස් කවයක් සකස් කරන්න.
- තම දකුණු පැත්තේ සිටින යහළුවා වෙත හැරී 'කලිමතුන් තයියිබා' හඬ නගා උච්චාරණය කරන්නට කවයේ එක් ශිෂ්‍යයකුට අවස්ථාව දෙන්න.
- මෙ ලෙස සෑම ශිෂ්‍යයකුට ම 'කලිමතුන් තයියිබා' සවන් දීමටත්, උච්චාරණයටත්, අවස්ථාව දෙමින් 'කලිමතුන් තයියිබා' කටපාඩම් කරවන්න.

**තක්සේරුව** :

- 'කලිමතුත් තයියිබා' නිවැරැදි ව උච්චාරණය කරයි.
- 'කලිමතුත් තයියිබා' කට පාඩමින් කියයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- ඊමානය ස්ථිර කිරීම උදෙසා කලිමාව සිහි ගැන්වීම

## 4. තේමාව : අත්තහාරා

**නිපුණතාව : එදිනෙදා ජීවිතයේ දී මුස්ලිම්වරු පිළිපැදිය යුතු සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කරයි.**

**ඉගෙනුම් පල** : 4.1

- ශරීර අවයව පිරිසිදුව තබා ගැනීමේ අවශ්‍යතාව ප්‍රකාශ කරයි.
- ශරීරය පිරිසිදු ව තබා ගනියි.

**ඉගෙනුම් සම්පත්** :

- සියලු ම සිසුන්ට දෑත් සේදීමට ජලය සහ සබන්
- චිත්‍ර ඇඳීමට සහ ඇලවීමට අවශ්‍ය ද්‍රව්‍ය, කතුරු සහ සාමූහික පෝස්ටරයක් නිර්මාණය සඳහා බ්‍රිස්ටල් බෝඩ්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :

පියවර 1 :
- සිසුන් මිදුලට කැඳවා ගෙන ගොස් සාමූහික ව පහත ගීතය ගායනා කරන්න.

  **දත් බුරුසුව ගෙන දත් මදිමූ**
  **කෑමට පෙර අත් සෝද ගමූ**
  **නාලා පිරිසිදුව ම හිඳිමූ**
  **සතුටින් දිවි ගෙවමූ**

- ඉස්ලාමීය දෘෂ්ටි කෝණයෙන් පිරිසිදුකම රැක ගැනීමේ වැදගත්කම සිසුන්ට වැටහෙන පරිදි සාකච්ඡා කරන්න.
- උදය, සවස මෙන් ම අපද්‍රව්‍ය තැවරීම, සෙල්ලම් කර අවසන් වීම, වැසිකිළියෙන් පිට වීම වැනි අවස්ථාවල දෑත්, දෙපා, මුහුණ යනාදී ශරීර අවයව සේදීමේ වැදගත්කම පෙන්වා දෙන්න.

පියවර 2 :
- විවේකයේ දී කෑම ගැනීමට පෙර සියලු ම සිසුන් පෙළ ගස්වා මිදුලට රැගෙන ගොස් සෑම ශිෂ්‍යයකුට ම හොඳින් සබන් ගා දෑත් සෝදා ගැනීමට ඉඩ සලසන්න.
- සිසුන්ට උදව් කරමින් පිරිසිදු අත පිස්නාවකින් දෑත් පිස ගැනීමටත්, සංවර ව ආහාර ගැනීමටත්, හුරු කරවන්න.
- එම අයුරින් දිනපතා පිරිසිදු ලෙසත්, පිළිවෙළටත්, ආහාර ගත යුතු බව පෙන්වා දෙමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 3 :
- සියලු ම සිසුන්ට අවශ්‍ය ද්‍රව්‍ය සපයා ශරීරය පිරිසිදු කරන කිසියම් අවස්ථාවක් චිත්‍රයට නැගීමට ඉඩ සලසන්න.
- සිසුන් ඇඳි පින්තූරය කපා වෙන් කර ගැනීමට උපදෙස් දෙන්න.
- සියලු දෙනා ම අඳින ලද පින්තූර රැස් කර බ්‍රිස්ටල් බෝඩ් එකක අලවා එහි සුදුසු ස්ථානයක 'අත්තහාරා' යනුවෙන් ලොකු අකුරින් ලියන්න.
- 'අත්තහාරා' යන්නෙහි අර්ථය සිසුන්ට පැහැදිලි කරන්න.

**තක්සේරුව** :

- ශරීරය පිරිසිදු කිරීමේ අවස්ථාවක් චිත්‍රයට නගයි.
- දෑත් හොඳින් සෝදා පිළිවෙළට ආහාර ගන්නා ආකාරය ප්‍රදර්ශනය කරයි.
- පිරිසිදු ව සිටීම තේමා කර ගත් ගීතයක් ගායනා කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- නිරෝගී ව ජීවත් වීම සඳහා පවිත්‍රතාව රැක ගැනීමේ පිළිවෙත් අනුගමනය කිරීම

## 4. තේමාව : අත්තහාරා

**නිපුණතාව : එදිනෙදා ජීවිතයේ දී මුස්ලිම්වරු පිළිපැදිය යුතු සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කරයි.**

**ඉගෙනුම් පල :** 4.2

- ගෙදරදොර භාවිත කරන භාණ්ඩ පිරිසිදු ව හා පිළිවෙළට තැබීමට යොමු වෙයි.
- නිවස අවට පරිසරය පිරිසිදු ව පවත්වා ගන්නා ආකාරය ප්‍රකාශ කරයි.
- පන්ති කාමරය පිරිසිදු කර සෑම භාණ්ඩයක් ම ඊට අදාළ ස්ථානයෙහි තැන්පත් කරයි.
- පන්තිය අවට පරිසරය පිරිසිදු කිරීමට හා අලංකාර ලෙස තබා ගැනීමට සහාය වෙයි.

**ඉගෙනුම් සම්පත් :**

- පිරිසිදු - පිළිවෙළ සහිත සහ අපිරිසිදු - පිළිවෙළ රහිත නිවසක (හෝ වෙනත් ස්ථානයක් දැක්වෙන පින්තූර
- මිදුල සහ පරිසරය පිරිසිදු කිරීමටත්, පැළ සිටුවීමටත්, අවශ්‍ය උපකරණ

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :

පියවර 1 :

- පිරිසිදු සහ අපිරිසිදු ස්ථාන දැක්වෙන පින්තූර ප්‍රදර්ශනය කරන්න.
- සිසුන් කැමැති කවර ස්ථානයකට ද යන්න විමසන්න.
- නිවසත්, පරිසරයත් අලංකාර ලෙස, පිළිවෙළට තබා ගැනීමේ ඉස්ලාමීය ක්‍රියා පිළිවෙත් විස්තර කරන්න.
- නැමැදුම් කිරීමේ ස්ථානය පිරිසිදු ව තිබේ නම් පමණක් එහි සලාතය ඉටු කළ හැකි බව සිහි ගන්වන්න.
- 'ඔබ අතරින් කෙනකු කිසියම් කාර්යයක් ඉටු කළේ නම්, එය පිළිවෙළට ඉටු කිරීම අල්ලාහ් ප්‍රිය කරන්නේ ය.' (හදීස්) යන්න පැහැදිලි කර දෙන්න.

පියවර 2 :

- තම නිවසෙහි භාවිත කරන භාණ්ඩ පිරිසිදුව, පිළිවෙළට තබා ගැනීම උදෙසා සිසුන්ට කළ හැකි දේ සාකච්ඡා කරන්න.
- පන්ති කාමරය පිරිසිදු ව තබා ගැනීම උදෙසා කළ හැකි දේ පිළිබඳ සිසුන් ගේ අදහස් විමසන්න.
- දෙමාපියන් ගේ ද සහයෝගය ලබා ගනිමින් සිසුන් සමඟ එක් ව පන්ති කාමරය පිරිසිදු අලංකාර ස්ථානයක් බවට පත් කර ගන්න.

පියවර 3 :

- පන්තිය අවට පරිසරය පිරිසිදු ව හා අලංකාරවත් ලෙස තබා ගැනීමේ අවශ්‍යතාව සාකච්ඡා කරන්න.
- දෙමවුපියන් ගේ ද සහයෝගය ඇති ව කල්තියා දැනුම් දී ගෙන්වා ගත් මල් පැළ සිටුවා පන්තිය අවට පරිසරය පිරිසිදු කර අලංකාර ව සකසන්න.
- දිනපතා පැළවලට වතුර දමා සාත්තු කර රැක ගැනීමට සිසුන් යොමු කරන්න.

- අප අවට පරිසරයේ ඇති මල් ගස් සහ අනෙකුත් ගස් වැල්වලට හානි නොකර ප්‍රයෝජනයට ගැනීම පිළිබඳ සාකච්ඡාවක් මෙහෙයවමින් සාමූහික ව පහත ගීතය ගායනා කරන්න.

**ගස් පිරිලා මල් ගොඩයි හරි ම ලස්සනයි**
**අප නෙළන්නෙ මල් ටිකයි ඉතිරිය ගසටයි**
**ඔක්කොම මල් නෙළුවොතින් ගසට දුක හිතෙයි**
**සමනලයට බඩ ගින්නේ ඉන්නට සිදු වෙයි**

**තක්සේරුව :**

- පන්ති කාමරය හා ඒ අවට පරිසරය පිරිසිදු කිරීමේ කටයුතුවලට සහභාගි වෙයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- තමා සිටින පරිසරය පිරිසිදු ව සහ පිළිවෙළට තබා ගැනීම

## 5. තේමාව : ඉස්ලාමීය ආචාර ධර්ම

### නිපුණතාව : දෛනික ජීවිතයේ දී මුස්ලිම් ආචාර ධර්ම අඛණ්ඩ ව පිළිපදියි.

**ඉගෙනුම් පල** : 5.1

- ආහාර අනුභවයට පෙරත්, පසුත්, සබන් යොදා දැත් සෝදා ගනියි.
- ආහාර අනුභව කරන විට හිඳගෙන ආහාර ගනියි.
- ආහාර අනුභව කරන විට පිළිපැදිය යුතු පිළිවෙත් හා පාරායනා අනුගමනය කරයි.
- කෑම අනුභව කිරීම ඉබාදතයක් බව ප්‍රකාශ කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- කණ්ඩායම් වශයෙන් අනුභවය සඳහා දෙමාපියන් ගේ සහයෝගය ඇති ව ගෙන එනු ලබන (සිසුන් හය දෙනකු ගේ කණ්ඩායමකට එකක් බැගින් බඳුන්වල බෙදන ලද) ආහාර
- පිරිසිදු ඇතිරිලි (කණ්ඩායමකට එකක් බැගින්)

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :

පියවර 1 :
- ආහාර අනුභව කිරීමට පෙරත්, ආහාර අනුභව කරන විටත්, ආහාර අනුභව කළ පසුත් අනුගමනය කරන ඉස්ලාමීය පිළිවෙත් සිසුන්ට හොඳින් අවධාරණය කරන්න.
- ආහාර අනුභවයේ දී අනුගමනය කළ යුතු පිළිවෙත් සියලු ම සිසුන්ට තනි තනි පැවසීමට අවස්ථාවක් ලබා දෙන්න.
- දිනපතා ආහාර අනුභව කිරීමට පෙරත්, ආහාර අනුභව කළ පසුවත්, පාරායනය කළ යුතු ප්‍රාර්ථනා සිසුනට පුරුදු කරන්න.

පියවර 2 :
- දෙමවුපියන්ගේ සහයෝගය ද ලබා ගනිමින් සිසු කණ්ඩායම්වලට ආහාර අනුභවය සඳහා පන්ති කාමරය තුළ පරිසරය නිසි පරිදි පිරිසිදු කරන්න.
- ඇතිරිලි යොදා ආහාර බඳුන් තබා දැත් සෝදා ගෙන පිරිසිදු වූ සිසු කණ්ඩායම් සංවර ව හිඳුවන්න.
- ගුරු මැදිහත් වීම සහිත ව නිවැරැදි ඉස්ලාමීය පිළිවෙත් අනුගමනය කරවමින් ආහාර අනුභවයට සිසුන්ට අවස්ථාව සලසන්න. (දෙමවුපිය සහයෝගය ද ලබා ගන්න.)

**තක්සේරුව** :

- ආහාර අනුභව කිරීමට පෙරත්, පසුත්, පාරායනය කළ යුතු ප්‍රාර්ථනා කරමින් ඉස්ලාමීය පිළිවෙත්වලට අනුව සංවර ව ආහාර ගනියි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- ඉස්ලාමීය පිළිවෙත් අනුගමනය කරවමින් ආහාර අනුභව කිරීම

## 5. තේමාව : ඉස්ලාමීය ආචාර ධර්ම

**නිපුණතාව : දෛනික ජීවිතයේ දී මුස්ලිම් ආචාර ධර්ම අඛණ්ඩ ව පිළිපදියි.**

**ඉගෙනුම් පල :** 5.2

- ඇඳුම් ඇඳීමට පෙරත්, අඳින විටත්, ගලවන විටත් නිසි පිළිවෙත් අනුගමනය කරයි.
- ඇඳුම් ඇඳීමේ දීත්, ගැලැවීමේ දීත් කළ යුතු ප්‍රාර්ථනා පාරායනය කරයි.
- ඇඳුම් නියමිත ස්ථානයෙහි පිළිවෙළට තබයි.

**ඉගෙනුම් සම්පත් :**

- සෑම ශිෂ්‍යයකු ම ගෙන එනු ලබන පාසලේ නිල ඇඳුමට පිටින් ඇඳ පෙන්විය හැකි ඇඳුමක් (කමිසයක්/හැට්ටයක් වැනි)

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :

පියවර 1 :
- සිසුන් ඇඳුම් අඳින විට නිවසෙහි අනුගමනය කරන පිළිවෙත් පිළිබඳ සාකච්ඡා කරන්න.
- ඇඳුම් ඇඳීමට පෙරත්, අඳින විටත්, ඒවා ගලවන විටත් අනුගමනය කරන ඉස්ලාමීය පිළිවෙත් සිසුන්ට හොඳින් අවධාරණය කරන්න.
- ඇඳුම් ඇඳීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු පිළිවෙත් සියලු ම සිසුන්ට තනි තනි ව පැවසීමට අවස්ථාවක් ලබා දෙන්න.
- ඇඳුම් අඳින විටත්, ගලවන විටත් පාරායනය කරන ප්‍රාර්ථනා නිවැරදි ව උච්චාරණය කර පෙන්වන්න.

පියවර 2 :
- තමා ගෙන එන ලද ඇඳුම නියමිත පිළිවෙත් අනුගමනය කරමින් (පාසල් නිල ඇඳුමට පිටින්) ඇඳීමටත්, ගැලැවීමටත් සෑම ශිෂ්‍යයකුට ම අවස්ථාව දෙන්න.
- ගෙන ආ ඇඳුම ගැසීම, ඇඳීම සහ නැවත පිළිවෙළට නවා අසුරා තැබීම කළ යුතු බවට සිසුන් දැනුවත් කරන්න.
- ඇඳුම් අඳින විටත්, ගලවන විටත් පාරායනය කරන ප්‍රාර්ථනා නිවැරදි ව උච්චාරණය කරන්නේ ද යි සැලැකිලිමත් වන්න.

**තක්සේරුව :**

- නිසි පිළිවෙත් අනුගමනය කරමින් ඇඳුමක් ඇඳ පෙන්වයි.
- ඇඳුම් අඳින විටත්, ගලවන විටත් නියමිත දුආ පාරායනය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- ඇඳුම් ඇඳීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු පිළිවෙත් අනුගමනය කිරීම

## 6. තේමාව : අඛ්ලාක් සහ ආදාත්

**නිපුණතාව : සාමූහික ජීවිතයට අදාළ ගුණධර්ම හා සාරධර්ම (අඛ්ලාක් හා ආදාත්) පිළිපදියි.**

**ඉගෙනුම් පල :** 6.1

- දෙමාපියන්ට, සහෝදරසහෝදරියන්ට හා ඥාතීන්ට සෙනෙහස දක්වන ලද අවස්ථා ඉදිරිපත් කරයි.
- දෙමාපියන්ට සහ ඥාතීන්ට සෙනෙහස දක්වමින් කටයුතු කරයි.
- දෙමාපියන්, සහෝදර සහෝදරියන්, ඥාතීන් හා ගුරුවරුන් ගේ යහපත් ඔවදන්වලට කීකරු වන අවස්ථා නාට්‍යයකින් ඉදිරිපත් කරයි.
- ගුරුතුමාට /ගුරුතුමියට ආදර ගෞරව දක්වයි.

**ඉගෙනුම් සම්පත් :**

- සිසුන් විසින් ගෙන එනු ලබන දෙමවුපියන්ට, සොහොයුරන්ට ආදරය දක්වන දර්ශන ඇතුළත් තමතමන් ගේ ඡායාරූප
- අල් කුර්ආන්, අල් හදීස් හි පහත රුවන් වැකිය (පරිවර්තනය සමඟ)
  'රබ්බනා රබ්බි ර්හම් හූමා කමා රබ්බයානි සර්රා' (අල් කුර්ආන්)
  'මිනිසාට සෙනෙහස නො දක්වන්නා වෙත අල්ලාහ් ද සෙනෙහස නො දක්වන්නේ ය.' (බුහාරි)

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :

පියවර 1 :
- දෙමාපියන්ට, සහෝදර සහෝදරියන්ට හා ඥාතීන්ට සෙනෙහස දක්වන ලද අවස්ථා සිසුන් ගෙන් විමසන්න.
- දෙමාපියන්, සහෝදරසහෝදරියන් සහ ඥාතීන් ගෙන් අපට මහත් උපකාර ඇති බව සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- **'රබ්බනා රබ්බි ර්හම් හූමා කමා රබ්බයානි සර්රා'** යන අල් කුර්ආන්, අල් හදීස් හි රුවන් වැකියෙහි අර්ථය වන **'මිනිසාට සෙනෙහස නො දක්වන්නා වෙත අල්ලාහ් ද සෙනෙහස නො දක්වන්නේ ය.'** යන්න සිසුන්ට පැහැදිලි කර දෙන්න.

පියවර 2 :
- කීකරු වීම ඉස්මතු කෙරෙන කෙටි නාට්‍යයක් නිර්මාණය කර එය රඟ දැක්වීමට සිසුන් යොමු කරන්න.

  *නිදා* : * පුතා මොනවා ද කරන්නේ?
  * මම ඉස්කෝලේ ගුරුතුමී දීපු ගෙදර වැඩ කරනවා.
  * බොහොම හොඳයි, අන්න එහෙම දරුවෝ ගුරුවරුන්ට කීකරු වෙන්න ඕනෑ.
  * .....................

පියවර 3 :
- ගුරු දිනයට ගුරුතුමාට/ගුරුතුමියට අල්ලාහ්ගේ ආශිර්වාද පතමින් සුබපැතුම් පතක් නිර්මාණය කරවන්න.
- එය ගුරුතුමා/ගුරුතුමියට පිළිගන්වන්න.

**තක්සේරුව :**

- දෙමාපියන්, සහෝදරස හෝදරියන්, ඥාතීන් හා ගුරුවරුන් ගේ යහපත් ඔවදන්වලට කීකරු වන අවස්ථා නාට්‍යයකින් ඉදිරිපත් කරයි.
- ගුරුතුමාට /ගුරුතුමියට ආදරයෙන් යුතු ව අල්ලාහ්ගේ ආශිර්වාද පතමින් සුබපැතුම් පතක් නිර්මාණය කර පිළිගන්වයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- දෙමාපියන්ට, සහෝදර සහෝදරියන්ට, ඥාතීන්ට හා ගුරුවරුන්ට සෙනෙහස දැක්වීම

## 6. තේමාව : අඛ්ලාක් සහ ආදාත්

**නිපුණතාව : සාමූහික ජීවිතයට අදාළ ගුණධර්ම හා සාරධර්ම (අඛ්ලාක් හා ආදාත්) පිළිපදියි.**

**ඉගෙනුම් පල : 6.2**

- පන්තියේ මිතුරුමිතුරියන් සමග සමගියෙන් හා එකමුතු ව ආහාරපාන බෙදාහදා ගනිමින් කුඩා සාදයක් පවත්වයි.

**ඉගෙනුම් සම්පත් :**

- දෙමවුපියන්ගේ සහයෝගය ඇති ව ගෙන එනු ලබන ආහාරපාන
- මේස රෙද්දක්, මල් බඳුන් සහ සැරැසිලි

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :

පියවර 1 :

- සාදයක් පිළිබඳ සතුට සහ උද්‍යෝගය ඇති වන අයුරින් 'අපි හැමෝ ම හැකි තරමින් කෑමබීම ගෙනැවිත් පන්තිය තුළ එකමුතු වී බෙදාහදා ගෙන සාදයක් පවත්වමු,' යැයි යෝජනා කරන්න.
- සාදය පැවැත්වීමට පෙර දින සිසුන් කැමති විසිතුරු දේ යොදා ගනිමින් පන්ති කාමරය සැරසීමට උපදෙස් දෙන්න.
- පන්ති කාමරය මැද මේසයක් සකසා එය මත ඇතිරිල්ලක් යොදා මල් බඳුනක් තබන්න.
- කල්තියා දෙමාපියන් දැනුවත් කර විවිධ ආහාරපාන බෙදා දී නියමිත දිනට ඒවා ගෙන්වා ගන්න. (බඳුන්වල බහා)
- අනුභවයට පෙර අනුගමනය කළ යුතු ඉස්ලාමීය පිළිවෙත් නිසි අයුරින් පිළිපදිමින් සමගියෙන් යුතු ව තමා ගෙන ආ දේ අන් අයට පිළිගන්වමින් ද, අන් අය පිළිගන්වන දේ සතුටින් භාර ගනිමින් ද, සංවර ලෙස ආහාර භුක්ති විඳීමට ඉඩ සලසන්න.
- අනතුරු ව සිසුන් කැමති රංගන, ගායනා ඉදිරිපත් කිරීමෙන් සතුටු වීමට ඉඩ දෙන්න.
- සාමූහික ව අල්ලාහ්ට ප්‍රශංසා කරමින් සාදය නිම කරන්න.

**තක්සේරුව :**

- සාදයක් පවත්වමින් සාමූහික ව සතුටු වෙයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- සමගියෙන් සහ සහයෝගයෙන් යුතු ව කටයුතු කිරීම

## 7. තේමාව : නබි (සල්) තුමාණන්ගේ ආදර්ශ

**නිපුණතාව : නබි (සල්) තුමාණන් කෙරෙහි සෙනෙහසින් යුතු ව එ තුමාණන්ගේ ආදර්ශ පිළිපදිමින් ජීවත් වෙයි.**

**ඉගෙනුම් පල :** 7.1

- මුහම්මද් නබි (සල්) තුමාගේ උපත සම්බන්ධ තොරතුරු ප්‍රකාශ කරයි.
- අස්සාදික් සහ අල් අමීන් යනු මුහම්මද් නබි (සල්) තුමා හඳුන්වන ගෞරව නාම බව පවසයි.
- නබි (සල්) තුමාගේ නාමයට සලවාත් පවසයි.

**ඉගෙනුම් සම්පත් :**

- මස්ජිදුන් නබවියේ සහ මක්කාවේ පින්තූර
- අල් කුර්ආන්, අල් හදීස් හි පහත රුවන් වැකිය

  **'අල්ලාහ් හා ඔහුගේ මලක්වරුන් නබිතුමා වෙත සලවාත් පවසන්නේ ය. විශ්වාසවන්තයිනි, නුඹලාත් එතුමා වෙත සලවාත් පවසන්න.'**
- 'තෝප්පුවකින්/ජුබ්බාවකින්' සැරසුණු ශිෂ්‍යයෙක්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :

පියවර 1 :
- මස්ජිදුන් නබවියේ සහ මක්කාවේ පින්තූර ප්‍රදර්ශනය කරමින් සිසුන් සමග මුහම්මද් නබි (සල්) තුමාගේ උපත සම්බන්ධ තොරතුරු සාකච්ඡා කරන්න.
- අල් කුර්ආන්, අල් හදීස් හි පහත රුවන් වැකිය තේරුම් කර දී සලවාත් පැවසිය යුතු අවස්ථා පෙන්වා දෙන්න.

  **'අල්ලාහ් හා ඔහුගේ මලක්වරුන් නබිතුමා වෙත සලවාත් පවසන්නේ ය. විශ්වාසවන්තයිනි, නුඹලාත් එතුමා වෙත සලවාත් පවසන්න.'**
- කණ්ඩායම් වශයෙන් හා තනි තනි වශයෙන් ක්‍රමානුකූල ව උච්චාරණය කරමින් සලවාත් කීමට සිසුන් මෙහෙයවන්න.

පියවර 2 :
- මුහම්මද් නබි තුමාගේ උපත හා කුඩා අවධිය සම්බන්ධ විද්වත් සාකච්ඡාවක් (බුද්ධි මණ්ඩල සාකච්ඡාවක්) පවත්වන ආකාරය පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
- මේ සඳහා මෞලවිතුමකු මෙන් රඟපෑමට 'තෝප්පුවකින්/ජුබ්බාවකින්' සැරසුණු ශිෂ්‍යයකු ද සූදානම් කරන්න.
- සුදුසු සිසු කණ්ඩායමක් යොදා ගනිමින් හා සිසුන්ට කිව යුතු කරුණු පවරා දෙමින් නියම කර ගනු ලැබූ දිනයක දී බුද්ධි මණ්ඩල සාකච්ඡාව පවත්වන්න.

*නිදු* :

**මෞලවිතුමා** - "අස්සලාමු අලෛකුම්."

**කණ්ඩායම** - "ව අලෛකුමුස්සලාම්."

**මෞලවිතුමා** - "අපි අද කතා කරමු මුහම්මද් නබි (සල්) තුමාගේ උපත ගැන. හැමෝ ම තමන් දන්නා තොරතුරු කියන්න."

**1 ශිෂ්‍යයා** - "හොඳයි, මුහම්මද් නබි (සල්) තුමා උපත ලැබුවේ මක්කා නගරයේ."

**2 ශිෂ්‍යයා** - "එතුමාණන්ගේ මව ආමිනා, පියා අබ්දුල්ලාහ්."

| | | |
|---|---|---|
| **3 ශිෂ්‍යයා** | - | "අනේ, උපතට පෙර ම එතුමාණන්ට පියාණන් අහිමි වුණා, එතුමාණන්ගේ පියාණන් මිය ගියා." |
| **4 ශිෂ්‍යයා** | - | "ඒ විතරක් නෙවෙයි, වයස අවුරුදු හයේ දී එතුමාණන්ගේ මවත් මිය ගියා." |
| **මෞලවිතුමා** | - | "එතුමා වෙනුවෙන් අපි සලවාත් කියමු." |

**තක්සේරුව :**

- මුහම්මද් නබි (සල්) තුමාගේ උපත හා කුඩා අවධිය සම්බන්ධ එක් තොරතුරක් පවසයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- නබි (සල්) තුමාගේ නාමයට සලවාත් පැවසීම

## 8. තේමාව : අල් කුර්ආනය

**නිපුණතාව : අල් කුර්ආනය හැඳින, පාරායනය කර, එහි උපදෙස් පිළිපදියි.**

**ඉගෙනුම් පල** : 8.1

- අල් කුර්ආනය පහළ වූ ආකාරය විස්තර කරයි.
- අල් කුර්ආනයෙන් යහමග පෙන්වන බව ප්‍රකාශ කරයි.
- මුස්ලිම්වරුන්ට ඇති වටිනා ම ග්‍රන්ථය වන අල් කුර්ආනයට නිසි ගෞරවය දක්වයි.
- සූරා ෆාතිහාව පාරායනය කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- අල්-කුර්ආනය
- 'සූරා ෆාතිහාව' ලියන ලද (බිත්තියේ එල්ලීමට හැකි ලෙස සැකැසූ) චාට් සටහනක්

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :

පියවර 1 :
- පෙර දින සිසුන් දැනුවත් කර පිරිසිදු ව (නෑමෙන් සහ පිරිසිදු ඇඳුම් ඇඳීමෙන්) පන්තියට ගෙන්වා ගන්න.
- ගුරු මේසය මත පිරිසිදු ඇතිරිල්ලක් යොදා සිසුන්ට පෙනෙන සේ අල්-කුර්ආනය ගෞරවයෙන් යුතු ව මේසය මත තබන්න.
- සියලු ම සිසුන් පෙළ ගස්වා එකිනෙකා පැමිණ අල්-කුර්ආනය දෑතට ගෙන නැවතත් ගෞරවයෙන් යුතු ව තැබීමට අවස්ථාව සලසන්න.

පියවර 2 :
- අල් කුර්ආනය නබිතුමාට පහළ වූ ආකාරය ඉදිරිපත් කිරීමට දන්නා සිසුනට අවස්ථාව දෙමින් ඒ පිළිබඳ තොරතුරු පවසන්න.
- අල් කුර්ආනයෙන් යහමඟ පෙන්වන ආකාරය පහදා දෙන්න.

  *නිද* : සලාතය, අධ්‍යාපනය, සත්‍ය කතා කිරීම, අන්‍ය ආගමිකයන්ට උදව් කිරීම, අන්සතු දේවල් නො ගැනීම
- මුස්ලිම්වරුන්ට ඇති වටිනා ම ග්‍රන්ථය වන අල් කුර්ආනයට නිසි ගෞරවය දක්වමින් එහි ඇති උපදෙස් පිළිපැදිය යුතු බව තහවුරු වන සේ සාකච්ඡාවක් මෙහෙයවන්න.

පියවර 3 :
- 'සූරා ෆාතිහාව' ලියන ලද චාට් සටහන සිසුනට ප්‍රදර්ශනය කරන්න.
- සිසුන් සමඟ එක් ව සාමූහික ව 'සූරා ෆාතිහාව' නිවැරැදි ව උච්චාරණය කරමින් පාරායනය කරන්න.

**තක්සේරුව** :

- සාමූහික ව 'සූරා ෆාතිහාව' පාරායනය කරයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- අල් කුර්ආනය අනුගමනය කිරීම

## 9. තේමාව : මස්ජිද්

**නිපුණතාව : මස්ජිදය මුස්ලිම්වරුන්ගේ පූජනීය ස්ථානය බව ප්‍රකාශ කරයි.**

**ඉගෙනුම් පල** : 9.1

- සලාතය ඉටු කරන පාරිශුද්ධ ස්ථානය වන මස්ජිදය අල්ලාහ්ගේ මාලිගාව බව ප්‍රකාශ කරයි.
- මස්ජිදයට පිරිසිදු ව යා යුතු බව පවසයි.
- මස්ජිදයේ ඇති වැදගත් ස්ථාන වන මිහ්රාබ් සහ මිම්බරය නිවැරැදි ව නම් කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- පාසල සමීපයේ ඇති මස්ජිදයක්
- විවිධ මස්ජිදවල පින්තූර

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :

පියවර 1 :
- කලින් දැනුවත් කර දෙමාපියන්ගේ ද සහයෝගය ඇති ව සිසුන් මස්ජිදයට කැඳවා ගෙන යන්න.
- මස්ජිදයේ ඇති වැදගත් ස්ථාන වන මිහ්රාබ් සහ මිම්බරය සිසුන්ට පෙන්වන්න.
- මස්ජිදය පිළිබඳ සිසුන්ගේ අදහස් විමසන්න.
- මස්ජිදයේ සලාත් ඉටු කරන ආකාරය සිසුන් සමග සාකච්ඡා කරන්න.
- මස්ජිදය තුළ අල්ප ශබ්දතාවෙන් යුතු ව හැසිරීමට සිසුන් යොමු කරන්න.

පියවර 2 :
- විවිධ මස්ජිදවල පින්තූර සිසුන්ට ඉදිරිපත් කරන්න.
- සලාතය ඉටු කරන පාරිශුද්ධ ස්ථානය වන මස්ජිදය අල්ලාහ්ගේ මාලිගාව බව පවසන්න.
- මස්ජිදයට කැමැත්තෙන් යාමටත්, එහි පූජනීය බව අගය කිරීමටත් සිසුන් මෙහෙයවන්න.

**තක්සේරුව** :

- මස්ජිදය තුළ සංයමයෙන් යුතු ව හැසිරෙයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

- කැමැත්තෙන් යුතු ව මස්ජිදයට යාම

## 10. තේමාව : ඉස්ලාමීය ඉතිහාසය

**නිපුණතාව : ඉස්ලාමීය ඉතිහාසයේ බිහි වූ විද්වතුන් ගේ ප්‍රතිපත්ති අගය කරමින් ඒවා ආදර්ශයට ගනියි.**

**ඉගෙනුම් පල** : 10.1

- ඉමාම් ගස්සාලි (රහ්) තුමා හඳුන්වයි.
- එතුමා අධ්‍යාපනයට දැක්වූ උනන්දුව විස්තර කරයි.
- එතුමා ආදර්ශයට ගනිමින් අප ද ඉගෙනීමට උනන්දු විය යුතු බව ප්‍රකාශ කරයි.

**ඉගෙනුම් සම්පත්** :

- අබූ හාමිද් නමැති පුද්ගලයාගේ කතාව
- චිත්‍ර ඇඳීමට අවශ්‍ය ද්‍රව්‍ය

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමවේදය :

පියවර 1 :
- පරිසරයේ සෙවණ ඇති ස්ථානයක හෝ වෙනත් නිසංසල පරිසරයකට සිසුන් කැඳවා ගෙන ගොස් හිඳ ගැනීමට සලස්වන්න.
- 'අද අපි කතාන්දරයක් අහමු' යැයි පවසා සිසුන් ගේ අවධානය ලබා ගන්න.
- පහත දැක්වෙන '**අබූ හාමිද් නමැති පුද්ගලයාගේ කතාව**' චිත්තාකර්ෂණීය ලෙස කියා දෙන්න.

**අතීතයේ අබූ හාමිද් නමැති පුද්ගලයෙක් සිටියා. ඔහු කුඩා කළ සිට ම ඉගෙනීමට දැක්වූවේ දැඩි ඇල්මක්. ඒත්, ඉගෙන ගන්නා දේවල් ඔහු ගේ මතකයේ රැඳුණේ ම නැහැ. ඔහු තවතවත් උත්සාහ කළා. මතක තියා ගන්නට බැරි වීම නිසා ඔහු මහත් සේ දුකට පත් වුණා.**

**දිනක් ඔහු ගමනක් යන විට පිපාසයක් දැනී වතුර ටිකක් බොන්නට අසල තිබුණු ළිඳක් වෙත ගියා.**

**වතුර ඇදීම සඳහා එම ළිඳ හරහා මහ විශාල ශක්තිමත් ලී කොටයක් දමා තිබුණා. වතුර අදින අතරේ අබූ හාමිද් මේ කොටය දිහා බොහොම සැලැකිල්ලෙන් බැලුවා. අබූ හාමිද්ගේ මුහුණේ සිනා රැල්ලක් මතු වුණා.**

**ජලය අදින බාල්දියේ ලණුවට ගෙවී එම කොටය මැද ගැඹුරු කාණුවක් ඇගිලියක් හැරී තිබුණා. 'දිගින් දිගට ම එක ම තැනින් වතුර ඇදීම නිසා මේ තරම් ශක්තිමත් කොටයක වුවත් නො මැකෙන ඇගිලියක් සෑදුණා නම් දිගින් දිගට ම උත්සාහ කළ හොත් මා ඉගෙන ගන්නා දේ මතකයේ නො රැඳිය හැක්කේ මන් ද යි' අබූ හාමිද් කල්පනා කළා.**

**අබූ හාමිද් අල්ලාහ්ට ප්‍රාර්ථනා කොට ආශීර්වාද ලබා ගෙන තව දුරටත් ඉගෙනීමෙහි යෙදුණා. ඔහු උගත් දේ මතකයේ රැඳෙන්නට වුණා. පසු ව ඔහු මහා උගතකු වුණා. පසු කලෙක ඉමාම් ගස්සාලි (රහ්) තුමා ලෙස හඳුන්වනු ලද්දේ එතුමාණෝ ය.**

- ඉමාම් ගස්සාලි (රහ්) තුමා පිළිබඳ සිසුන්ගේ අදහස් විමසන්න.
- එ තුමාගෙන් ගත හැකි ආදර්ශය පෙන්වා දෙමින් 'අප ද කවර හේතුවක් නිසා වත් අධෛර්යයට පත් නො වී හොඳින් ඉගෙන ගත යුතු ය' යන්න සිසුනට ඒත්තු ගන්වන්න.

**පියවර 2 :** • ඉමාම් ගස්සාලි (රහ්) තුමා පිළිබඳ කතාව නැවත සිසුනට සිහි ගන්වන්න.

• එම කතාවේ තමා සිත් ගත් ඕනෑ ම අවස්ථාවක් චිත්‍රයට නැගීමට උපදෙස් දෙන්න.

**තක්සේරුව :**

• ඉමාම් ගස්සාලි (රහ්) තුමා පිළිබඳ කතාවේ අවස්ථාවක් චිත්‍රයට නඟයි.

**ප්‍රායෝගික ජීවිතයේ භාවිතය සඳහා**

• අල්ලාහ්ට ප්‍රාර්ථනා කරමින් ධෛර්යයෙන් යුතු ව නො පසුබට ව කටයුතු කිරීම

# තක්සේරු කිරීම

# ඉස්ලාම් තක්සේරු කිරීමේ පත්‍රිකාව

| | |
|---|---|
| ප්‍රවීණතා මට්ටමට පැමිණ ඇත. | √ |
| ප්‍රවීණතා මට්ටමට පැමිණ නැත. | • |

| | | | | | | | ශිෂ්‍යයාගේ නම |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | 1. 'බිස්මලා' අඩංගු චාට් සටහන විසිතුරු කිරීමට සාමූහික ව දායක වෙයි. |
| | | | | | | | 2. 'බිස්මලා' පවසමින් පන්තියේ කටයුතු ආරම්භ කරයි. |
| | | | | | | | 3. 'අල් ඉස්තිආදා' නිවැරැදි ව හා සම්පූර්ණයෙන් ම උච්චාරණය කරයි. |
| | | | | | | | 4. කොටස්වලට වෙන් කරන ලද කැබලි ගළපමින් 'අල්හම්දුලිල්ලාහ්' යන ප්‍රකාශය අඩංගු චාට් සටහන ගොඩනගයි. |
| | | | | | | | 5. 'ලා ඉලාහ ඉල්ලල්ලාහ්'යන්න නිවැරැදි ව උච්චාරණය කර පවසමින් තමාගේ අසුනේ හිඳ ගනියි. |
| | | | | | | | 6. අල්ලාහ්ගේ මැවීමට ස්තුති කරමින් ගීතයක් ගායනා කරයි. |
| | | | | | | | 7. පරිසරයේ දර්ශනයක් නිර්මාණය කිරීමට දායක වෙයි. |
| | | | | | | | 8. 'කලිමතුත් තයියිබා' නිවැරැදි ව උච්චාරණය කරයි. |
| | | | | | | | 9. පන්ති කාමරය හා ඒ අවට පරිසරය පිරිසිදු කිරීමේ කටයුතුවලට සහභාගි වෙයි. |
| | | | | | | | 10. ආහාර අනුභව කිරීමට පෙරත්, පසුත්, පාරායනය කළ යුතු ප්‍රාර්ථනා කරමින් ඉස්ලාමීය පිළිවෙත්වලට අනුව සංවර ව ආහාර ගනියි. |
| | | | | | | | 11. නිසි පිළිවෙත් අනුගමනය කරමින් ඇඳුමක් ඇඳ පෙන්වයි. |
| | | | | | | | 12. දෙමාපියන් සමග එක් ව යහපත් කටයුතුවල නිරත වෙයි. |
| | | | | | | | 13. දෙමවුපියන්, සහෝදර සහෝදරියන්, ඥාතීන් හා ගුරුවරුන් ගේ යහපත් ඔවදන්වලට කීකරු වන අවස්ථා නාට්‍යයකින් ඉදිරිපත් කරයි. |
| | | | | | | | 14. ගුරුතුමාට/ගුරුතුමියට ආදරයෙන් යුතු ව අල්ලාහ්ගේ ආශීර්වාද පතමින් සුබ පැතුම් පතක් නිර්මාණය කර පිළිගන්වයි. |
| | | | | | | | 15. සාදයක් පවත්වමින් සාමූහික ව සතුටු වෙයි. |
| | | | | | | | 16. මුහම්මද් නබි (සල්) තුමාගේ උපත හා කුඩා අවධිය සම්බන්ධ එක් තොරතුරක් පවසයි. |
| | | | | | | | 17. සාමූහික ව 'සූරා ෆාතිහාව' පාරායනය කරයි. |
| | | | | | | | 18. මස්ජිදය තුළ සංයමයෙන් යුතු ව හැසිරෙයි. |